


# ජේ එච්

## මොණරතැන්නේ ප්‍රතාපවත් රජ්ජුරුවන් අමතක ද?

## සම්මාන ලී කැබැල්ලක් පුදා කලාකරුවන් අමතක කර දමන සමාජයක කතාව

'මම ඉපදිලා තියෙන්නේ 1921 අප්‍රේල් මාසේ 15 වෙනිදා දවල් 01.15ට කඩුවෙල, කොතලාවල, ඒ කාලේ අපි හිටපු ගෙදරදි'
ජේ.එච්. අපේ කතා බහ අරඹන්නේ සිය ජීවිතයේ ආරම්භය එලෙසින් ප්‍රකාශ කරමිනි. කලාකරුවකු ලෙස කලකට පෙර අපි වේදිකා නාට්‍යයෙන්, සිනමාවෙන් හෝ රූපවාහිනී තිරයෙන් දුටු ජේ.එච්. ජයවර්ධනගේ රූපකාය යළිත් කිසිදාක නොඑන ලෙස අද වන විට ඔහුගෙන් දුරස්ව ගොසිනි. රෝග පීඩා ගණනාවකින් ද වයෝවෘද්ධභාවයෙන් ද බලවත් සේ පීඩා විඳින ඔහුගේ කය කුඩා කාමරයක ඇඳක් මත එකම ඉරියව්වකින් හොවා ඇත. එහෙත් මීට දශක කීපයකට පෙර ගුවන් විදුලියෙන් පවනට වැද, අපගේ සවන්පත් වැකුණු මොණරතැන්නේ රජ්ජුරුවන්ගේ ගැඹුරු හඬ තවමත් ඔහු අතැරගොස් නැත.

### අගුරු මඩුවෙන් තිඹිරි ඇඳට

'දැන් තමයි මේ දොස්තරලා බෝවෙලා, ළමයි හම්බුවෙන එක ලෙඩක් විදිහට සළකන්නේ. ඒ කාලේ ළමයි හම්බවෙනවා කියන්නේ සාමාන්‍ය දෙයක්. ඕකට ඉස්පිරිතාල ගානේ ගියේ නෑ. හැම ගෙදරකම වෙනම කාමරයක් තිබුණා 'තිඹිරි කාමරය' කියලා. ගමේ වින්නඹු අම්මලා තමයි ළමයි ගත්තේ. අපේ අම්ම දවල්ට කාලා, නාලා පුටුවක හාන්සිවෙලා ඉන්නකොට ඔන්න චුරු චුරු ගාලා වතුර වැක්කෙරෙන සද්දයක් ඇහිලා තියනවා. මේක දැකපු සීයා ඉක්මනට වින්නඹු අම්මට පනිවිඩ යවලා ගෙන්නලා. අම්මව තිඹිරි කාමරේ ඇඳට අරගෙන ටික වෙලාවකින් මාව හම්බ වෙලා.'
ජේ.එච්. පවසන්නේ තමන් උපදින විට අගුරු කළු පැහැයෙන් යුක්ත දරුවකු වූ බවය. කොතරම් කලු පැහැයෙන් යුක්තවීද යත්, උපතින් පසු මුලින්ම තිඹිරි කාමරයට පැමිණ ඔහු දෙස බැලූ සීයා 'පුතේ, උඹ ආවේ අගුරු මඩුවෙන්ද' යි විමසා ඇති බව ඔහු සිහිපත් කරන්නේ සිනාසෙමිනි.

ශ්‍රීලාල් සෙනෙවිරත්න

'මගේ සීයා ඇපෝතිකරි කෙනෙක්. පුංචි කාලේ සීයා මාව බොහොම ආදරයෙන් රැක බලාගෙන තියනවා. මම ඉපදුනාට පස්සේ හඳහන බැලුව කෙනා කියලා තියනවා මේ ළමයා හදාගන්න නම් බොහොම අමාරුවෙයි. මෙයා උපන්ගෙයි ලෙඩෙක් කියලා. සීයා කිව්වලු ඒක අපි බලාගන්නම් කියලා. හඳහන බලලා කිව්වා වගේම පුංචි කාලේම මගේ ඇස් නොපෙනෙන තත්ත්වයකට ඇවිල්ලා තියනවා. සීයා තමයි අවුරුදු දෙක හමාරක් විතර බෙහෙත් කරලා සනීප කරලා තියෙන්නේ. මේ අසනීපෙ නිසා මට පුංචි කාලේ දුන්නේ අම්මගේ කිරියි, එළු කිරියි දෙක විතරයි. ඒකට වෙනම එළු පට්ටියක් ගෙදර ඇති කරලා තියනවා.'

කුඩා කල ජේ.එච්. පෙලූ අක්ෂි ආබාධය සුව කරදීමට සිය ඇපෝතිකරි සීයා සමත් වුවද වියපත් වෙද්දී යළිත් සිය දෑස ගිලගත් අක්ෂි ආබාධයෙන් ඔහුව සුවපත් කරලන්නට කිසිවෙක් සමත්ව නැත. ඒ හේතුවෙන් අද වන විට ජේ.එච්. ගේ දෑස නොපෙනේ. 1977 වසරේ සිට ක්‍රමයෙන් ඇස් පෙනීම දුර්වල වී 1998 වන විට මුලුමනින්ම පෙනීම අහිමිවන ජේ.එච්. එදා සිට අද දක්වා දිවි ගෙවන්නේ අඳුරු ලොවකය. වයස අවුරුදු 92ක් ව, කායිකව ද බෙහෙවින් දුබලව සිටියද ජේ.එච්. ගේ මතක ශක්තියේ අඩුවක් දැක ගන්නට නැත. ඔහු අතීතය වචනයට නගන්නේ සිත සිතා කල් මරමින් නොව, කුඩා දරුවෙක් වන පොත් කළ යමක්

## ජේ.එච්. ජයවර්ධන

මෙයින් සිය වසකට පමණ පෙර තලංගම කොස්වත්තේ විසූ එල්.එම්.පී. ජයවර්ධන නොතාරිස් රාළහාමි සහ බිරිය චාලට් ලිසී පෙරේරා යුවලගේ වැඩිමල් පිරිමි දරුවා ලෙස ජිනදාස හරිස්චන්ද්‍ර ජයවර්ධන මෙළොව එළිය දුටුවේ 1921 අප්‍රේල් 15 දින කඩුවෙල කොතලාවලදීය. දකුණු තලංගම සිංහල විද්‍යාලයෙන් පස්වන ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලද ඔහු පසුව කොළඹ නාලන්ද විද්‍යාලයටද, අනතුරුව කුරුණෑගල මලියදේව විද්‍යාලටද ඇතුළත්ව සිය පාසල් අධ්‍යාපන කටයුතු අවසන් කළේ ලන්ඩන් විශ්ව විද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලබමිනි. එහෙත් විදෙස් ගතවීමට බලවත් අකමැත්තක් දක්වූයෙන් උසස් අධ්‍යාපනය සඳහා ඔහුට ලැබී තිබූ අවස්ථාව අහිමිවිය.

අනතුරුව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් බඳවාගැනීම සඳහා එවක පැවැති විභාගයකට පෙනී සිට ඉන් සමත් වූ ඔහුට ප්‍රථම පත්වීම ලැබෙන්නේ රත්නපුරයටය. කෙටි කලක් සිය පවුලෙන් දුරස්ව රත්නපුරයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා ලෙස කටයුතු කරන අතර එවක රජයේ ලිපිකරු තනතුරු සඳහා බඳවා ගැනීමේ විභාගයකට පෙනී සිටි ජයවර්ධන තරුණයා එයින්ද සමත්විය. රජයේ ලිපිකරු සේ-වයේ ඔහුගේ ප්‍රථම පත්වීම ලැබෙන්නේ කොළඹ විදුලි දෙපාර්ථමේන්තුවටය. පසුව රජයේ දෙපාර්ථමේන්තු ගණනාවකම සේවය කිරීමෙන් අනතුරුව ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම යන්නේ 1975 වසරේදීය.

ජිනදාස හරිස්චන්ද්‍ර ජයවර්ධන එලෙස රජයේ සේවයෙන් විශ්‍රාම ගත්තද ඉන් පසුව ඔහුට විවේක සුවයෙන් ගෙවන ජීවිතයකට හිමිකම් කියන්නට අවස්ථාවක් නොලැබුණි. ඒ වන විට ඔහු ජේ.එච්. ජයවර්ධන යන නමින් ප්‍රකට කලාකරුවකු බවට රූපාන්තරණය වී සිටීම ඊට හේතුවයි. කලා ලෝකයට ජේ.එච්. ගේ ආගමනය සිදුවන්නේ ඔහු රජයේ සේවයේ ලිපිකරුවකුව සිටියදී හඳුනාගන්නට ලැබුණු වෘත්තීය සගයකු මාර්ගයෙනි. ප්‍රේමරත්න වැලිකළ (පී. වැලිකල) නම් වූ මේ වෘත්තීය සගයා පසු අවස්ථාවක ලිපිකරු සේවයෙන් ඉවත්ව ගුවන් විදුලි සංස්ථාවේ රැකියාවට ගොස් ජේ.එච්.ට ද ගුවන් විදුලියේ නාට්‍ය අංශයට සම්බන්ධ වෙන ලෙස. ඉල්ලීමක් කළේය. ඒ අනුව හේ ගුවන් විදුලි නාට්‍ය හඬ කැවීම් ශිල්පියෙකු ලෙස ගුවන් විදුලියේ මහගෙදරට පා තැබුවේය.

එවක ගුවන්විදුලියේ අතිශය ජනප්‍රිය නාට්‍යයක් වූ 'මොණරතැන්න' නාට්‍යයේ රජ්ජුරුවන්ට පණ ලැබුණේ ජේ.එච්. ගේ හඩිනි. පසුව ගුවන් විදුලියේ නාට්‍ය අංශයේ නියෝජ්‍ය වැඩසටහන් අධ්‍යක්ෂ තනතුරද හෙබවූ ජේ.එච්. 'විසි පැණ', 'පද පෙරළි', 'දැනුම මිනුම' වැනි ප්‍රශ්ණ විචාරාත්මක වැඩසටහන් මෙහෙයවමින් නිවේදකයකු ලෙසද සිය අනන්‍යතාවය සටහන් කිරීමට සමත්විය.

ජේ.එච්. ජයවර්ධන එලෙස කලා ලෝකයේ ඇරඹූ ගමන අවසන් වන්නේ වේදිකාව, සිනමාව සහ ටෙලි නාට්‍ය ක්ෂේත්‍රයේ සුවිශේෂී රංග ප්‍රතිභාවක් ප්‍රකාශනයට පත්කළ සම්මානනීය චරිතාංග නලුවෙකු ලෙසිනි.
හඬකැවීම් ශිල්පියෙකුගෙන් අරඹා ගුවන් විදුලි නාට්‍ය රචකයකු, නිෂ්පාදකයකු ලෙස දක්වූ කුසලතාවයන් නිසාම පසුව පී වැලිකළ විසින්ම ජේ.එච්. වේදිකාවටද හඳුන්වා දුන්නේය. ගුවන් විදුලිය මෙන්ම වේදිකාවද දිග්විජය කළ ජේ.එච්. ගේ මුල්ම වේදිකා නාට්‍ය වූයේ 'කෝ-න්තරය' යි. පසුව ඔහු විසින් නිෂ්පාදනය කළ 'දොන් සිමන්' නාට්‍ය 1966 වසරේ රාජ්‍ය නාට්‍ය උළෙල ද නියෝජනය කළේය. 'හිරු නැති ලොව' (1974), 'ඉඩම' (1975), 'කැළණි පාලම'(1978), 'සිහින සාප්පුව'(1991), 'මකරාක්ෂයා'(1985) ඔහුගේ රංග ප්‍රතිභාව වේදිකාවේ ප්‍රදර්ශණය කළ නාට්‍ය නිර්මාණ අතරින් කීපයකි. කළ ආර්.ආර්. සමර-කෝන්, ධර්මසිරි බණ්ඩාරනායක,පරාක්‍රම නිරිඇල්ල ආදී කෘතහස්ත නාට්‍යවේදීන්ගේ නාට්‍ය නිර්මාණවලට සම්බන්ධවෙමින් සිය රංග ප්‍රතිභාව විදහා දක්වීමේ ප්‍රතිපලයක් ලෙස ඔහුට සිනමාවට සම්බන්ධවීමට ද අවස්ථාව ලැබුණි.

ජේ.එච්. සිනමාවට පිවිසෙන්නේ ශාන්ති කුමාර සෙනෙවිරත්නගේ 'එදා රෑ' චිත්‍රපටියෙනි. පසුව ධර්මසිර් බණ්ඩාරනායක, පරාක්‍රම නිරිඇල්ල, සතිස්චන්ද්‍ර එදිරිසිංහ ප්‍රමුඛ නිර්මාණකරුවන්ගේ සිනමා නිර්මාණයන්ට රංගනයෙන් දායක වූ ඔහු 'අධිෂ්ඨානය' චිත්‍රපටියේ කළ රංගනය වෙනුවෙන් ජනාධිපති සිනමා සම්මානයෙන් ද පිදුම් ලැබුවේය.

අද වන විට මේ සියලු භූමිකාවන්ගෙන් මිදී වියපත්බවත්, රෝගී කයත් උරුම කරගත් ජේ.එච්. සිය ජීවිතයේ සැඳෑ සමය ගෙවා දමමින් සිටින්නේ බොහෝ වෙහෙසකර ආකාරයෙනි. ඔහුගේම වචනයෙන් පවසන්නේ නම් ඔහුගේ දැන් එකම ප්‍රාර්ථනය 'මරණය'යි. මින් වසර දහතුනකට පමණ පෙර ග්ලුකෝමා නම් රෝගය වැලඳීමෙන් ඇස් පෙනීම මුලුමනින්ම අහිමිවීමත්, පසුව අංශභාග රෝගයට ගොදුරුවීමත් නිසා එතෙක් ගත කළ සමාජීය ජීවිතයට සමුදී ලෙඩ ඇඳට වැටුණු ඔහුගේ රැකවරණයට එතැන් සිට සිටියේ බිරිය ස්වර්ණා සුමේධා ජයවර්ධනය. ඇයද මීට මාස කීපයකට පෙර වැටීමකින් අස්ති බිඳීමකට ලක්ව රෝගීවීමෙන් පසු ජේ.එච්.ට එතෙක් විසූ සිය නිවෙස අතහැර බිරියත් සමඟ තම එකම දියණියගේ නිවෙසට පැමිණෙන්නට සිදුවිය. 'සන්නස' වෙනුවෙන් ඉකුත්දා මම ජේ.එච්. මුණගැසුණේ කදානේ පොලිසිය ඉදිරිපිටින් දිවෙන ශාන්ත පියෝ මාවතේ පිහිටි එම නිවෙ-සේදීය. ඔහුට හෝ ඔහුගේ බිරියට දුරකථනයක් නොමැති බැවින් පාඨක ඔබට ඔහු හා ඍජුව සම්බන්ධ විය හැකි මගක් මෙහි සටහන් කළ නොහැකිය. එහෙත් මෙහිලා විශේෂනේ සටහන් කළ යුත්තක් තිබේ. එය නම් ජේ.එච්.ගේ වචනයෙන්ම කියතොත් 'සොච්චම් පැන්ෂන්' එකකින් රැකෙන තමන් වෙනුවෙන් පාඨක ඔබට කළ හැකි යම් උපකාරයක් වේ නම් එය සතුටින් බාරගැනීමට ඔහු සූදානම් බවය.

ඒ වෙනුවෙන් අතරමැදියකු වන්නට සන්නස කැමති ය